සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020(I)**

| කාලය: පැය 03 | මූල්‍ය ක්‍රම (05-I) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................. |
|---|---|---|

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. රජයේ කාර්යාලයක තාප්පයක් කඩා වැටීම හේතුවෙන් ඒ අසල නවතා තිබූ රජයේ වාහනයකට හා පෞද්ගලික වාහනයකට අලාභයක් සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් "පූර්ණ වාර්තාවක්" ඉදිරිපත් කරන ලෙස ඔබට පැවරී ඇත. මෙම උක්ත වාර්තාව සැකසීමේ දී,

    i. මෙම සිදුවීමට අදාළව හානිය හඳුනාගැනීමට ඔබ යොදාගන්නා නිර්ණායක මු.රෙ.102 පරිදි පැහැදිලි කරන්න. (ලකුණු 10)

    ii. ඔබ විසින් සකස් කරන "පූර්ණ වාර්තාව" සඳහා මු.රෙ. 104(4) අනුව ඇතුළත් කළ යුතු කරුණු මොනවාද? (ලකුණු 10)

    (මුළු ලකුණු 20)

02. i. එකාබද්ධ අරමුදලින් වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන කරන "සැපයුම් සේවා" හා "විශේෂ නිතී සේවා" වියදම් වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 10)

    ii. එකාබද්ධ අරමුදලින් වියදම් දැරිම සඳහා වාර්ෂික වියදම් ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමේ දී අයවැය වර්ගීකරණ ඒකක ලෙස යොදාගන්නා ශිර්ෂය, වැඩසටහන, ව්‍යාපෘතිය හා වැය විෂයයන් සවිස්තරාත්මක පහදන්න. (ලකුණු 10)

    (මුළු ලකුණු 20)

03. i. ඉදිකිරිම් කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කළ වැඩ සඳහා කරනු ලබන වාරික මුදල් ගෙවීමකදී අදාළ ගෙවිම අනුමත කිරීමේ නිලධාරි ලෙස ඔබ විසින් සැලකිල්ලට ගත යුතු කරුණු මොනවාද? (ලකුණු 10)

    ii. ඉදිකිරිම් කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ගෙවිය යුතු රඳවා ගන්නා ලද මුදල් ආපසු ගෙවීම සඳහා තැන්පතුවකින් ආපසු ගෙවීම සහතික කරන නිලධාරියා ලෙස ඔබගේ වගකීම කුමක්ද? (ලකුණු 10)

    (මුළු ලකුණු 20)

04. i. මුදල් වර්ෂයක අනුදත් (විසර්ජන පනතෙන් බලය ලැබූ) ගෙවීම් සඳහා ගණන්දීමේ නිලධාරියෙකුට ලබා දෙන අග්‍රිමය, අතුරු අග්‍රිමයක් ලෙස ලබාදීමේ දී හා ආපසු පියවීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. විසර්ජන පනතෙන් අනුමත කරන ලද ප්‍රතිපාදන සඳහා මුදල් නිදහස් කිරීමට නිකුත් කරනු ලබන වොරන්ට් බලපත්‍ර වර්ග හතරක් (04) කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. කාර්යාලය සඳහා ලැප්ටොප් පරිගණක 100ක් මිල දී ගැනීමේ දී ප්‍රසම්පාදන කාර්යයේ තාක්ෂණික ඇගයීම් කමිටු සමාජිකයෙකු ලෙස ඔබ පත්කර ඇත.

i. තාක්ෂණික ඇගයීම් කමිටු සමාජිකයෙකු ලෙස ඔබගේ වගකීම ද එම වගකීම ප්‍රසම්පාදන කමිටු සමාජිකයෙකුගේ වගකීමෙන් වෙනස් වන ආකාරය ද පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. උක්ත ප්‍රසම්පාදන කාර්යය සඳහා කෙටුම්පත් කරන ලද ප්‍රසම්පාදන ලියවිලි කට්ටලයේ විවිධ කොටස් නම් කර එම එක් එක් කොටස යටතේ ඇතුළත් විය යුතු කරුණු පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. i. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 (භාණ්ඩ හා වැඩ) මගින් දක්වා ඇති පරිදි ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ පරමාර්ථ සවිස්තරාත්මකව දක්වන්න. (ලකුණු 10)

ii. ලංසු ඇගයීමේ දී සැලකිල්ලට ගනු ලබන සුළු බැහැරවීම් හා විශාල බැහැරවීම් විස්තර කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**************